Department of Education, Sabaragamuwa Province/ Weekly School

විෂය : පෙරදිග සංගීතය

සතිය : 3 වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

**ආදේශ භාණ්ඩ හා නිෂ්චිත සංගීත භාණ්ඩ එකතුව මාතෘකාවට අදාලව නිර්මාණයේ යෙදීම.(වැස්ස/කෝච්චිය)**

## "කෝච්චිය" සංගීතමය නිර්මාණය



අවශ්‍ය දෑ: -

- X-ray කාඩ් වලින් සාදාගත් drum එකක් හා කෝටු දෙකක්
- පොලිතීන්
- ගම් බෝතල් දෙකක්
- ටින් කිහිපයක්
- (ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක්)

ක්‍රියාකාරකම -

- (පළමු පියවර) කෝච්චියක් ගමන් ආරම්භ කිරීමට සූදානම්වන මොහොතක් හොඳින් සිහියට නගාගන්න. ගම්බෝතල් එකකට වැඩි වතුර ප්‍රමාණයක් හා අනෙකට අඩු වතුර ප්‍රමාණයක් යොදාගැනීමෙන් කෝච්චියක නලාවට සමාන හඬක් ලැබෙන අතර එම ගම් බෝතල් දෙක ස ස්වරයට සහ ග ස්වරට සුසර කරගැනීම වඩාත් උචිත වේ. කෝච්චිය ගමන් ආරම්භ කිරීමට ප්‍රථම නලාව නාද කරන්න. පොලිතීන් අත් දෙකෙන් පොඩිකිරීමෙන් කෝච්චියේ එන "කුසු කුසු" නාදය ලබාගත

හැකි වේ. මෙම ක්‍රියාකාරකමට ඔබගේ මිතුරන් හෝ පවුලේ අය සහභාගී කරගන්න.

- (දෙවන පියවර) ගමන් ආරම්භ කිරීමේදී ඉතා අඩු ලයකින් **X-ray** කාඩ් වලින් සාදාගත් **drum** එකෙන් හා ටින් වලින් පහත රිද්ම රටාව වාදනය කරන්න. ස්වර පුවරු භාණ්ඩයකින් පහත ඇති තනුව හෝ ඔබ විසින් සාදාගත් සරල තනුවක් වාදනය කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| xx | -x | x | - | xx | -x | x | - |
| ස | රි | ස | - | ස | රි | ග | - |
| රි | ග | රි | - | ග | රි | ස | - |

දැන් කෝච්චචියේ වේගය වැඩිවන ආකාරයට ලය වැඩි කරන්න.

- (තුන්වන පියවර) දැන් **1 2 3 / 1 2 3** තාලයට මාරු කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 |
| X | X | X | X | X | - |

ඉහත රිද්මය සඳහා සුදුසු තනුවක් ශුදධ ස්වර ඇසුරෙන් නිර්මාණය කරගන්න.

නැවත කෝච්චචියේ වේගය වැඩිවන ආකාරයට ලය වැඩි කරන්න.

- (හතරවන පියවර)

නැවත **1234/1234/** තාලයට මාරු කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| X | X | - | X | X | - | - | - |

ඉහත රිද්මය සඳහා සුදුසු තනුවක් ශුදධ ස්වර ඇසුරෙන් නිර්මාණය කරගන්න.

නැවත කෝච්චචියේ වේගය දෘත ලය දක්වා වැඩිකර නැවත කෝච්චිය නවත්වන ආකාරයට ලය අඩු කරන්න. මෙම සංගීතමය දුම්රිය ගමනේ අතරමගදී රිද්මයානුකූලව නලාව වාදනය කරන්න. මෙම නිර්මාණයට සුදුසු නාදමාලා ඔබ විසින්ම නිර්මාණය කරන්න.